# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 12,073 — 1960 මාර්තු 4 වැනි සිකුරාදා — 4.3.1960**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)**

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

**(වෙන වෙනම ගොනු කර ගතහැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම, පිටු අංක යොදා ඇත)**


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ... | 325 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | 325 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | 326 |
| වෙනත් පත් කිරීම් ... ... ... | 327 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... | 327 |

| | පිට |
|---|---|
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 328 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 330 |
| "සුරාබද්ද ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම්

**1960 අංක 111**

අංකය : ඩී. 1/රෙක් ට/21.

**යුධ හමුදාව—නිත්‍යභට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්**

1959 ජූලි මස 2 වැනි දින සිට, ලෙප්ටිනන්ට් කෙනෙකු වශයෙන් —

උප ලෙප්ටිනන්ට් කිව්. සී. බටුවිටගේ, සී.ඒ.ඇස්.සී.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

එච්. ඊ. තෙන්නකෝන්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
සහිර. ලේකම්.

1960 පෙබරවාරි මස 18 දින,
කොළඹ.

---

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

**1960 අංක 112**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව පහත සඳහන් පත් කිරීම් කරන ලෙස නියමකර ඇත්තේ ය :—

ඒ. 59/60.

1960 පෙබරවාරි මස 8 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ගොවිජන සේවා කොමසාරිස් ඩී. ජී. දයාරත්න මහතා (සී. සී. ඇස්.) සමකීය රාජකාරිවලට අතිරේකව සංස්කෘතික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ වශයෙන් වැඩ බැලීමට.

ඒ. 68/60.

1960 පෙබරවාරි මස 17 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ඩී. සී. ද වාස් ගුණසේකර මහතා (සී. සී. ඇස්.) රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් වශයෙන්.

ඒ. 331/59.

1959 සැප්තැම්බර් මස 1 වැනි දින සිට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තක්සේරුකරුවන් සී. සිවප්‍රකාසම්, ඊ. බී. සී. ජය සුන්දර, කේ. ඇස්. පරාක්‍රම සහ ඩබ්ලිව්. රාජේන්ද්‍රා යන මහතුන් ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවන් වශයෙන්.

ඒ. 331/59.

1959 සැප්තැම්බර් මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තක්සේරුකරුවන් ඇස්. ජේ. වේදනායගම්, එච්. ඇන්. පොන්නම්බලම්, ටී. මුරුගේසර් සහ එච්. ඊ. ඩබ්ලිව්. සොලමන්ස් යන මහතුන් ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවන් වශයෙන් වැඩ බැලීමට.

ඒ. 287/59.

1959 සැප්තැම්බර් මස 21 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පළමුවෙනි පෙළේ ජේලර්වරු එච්. ආර්. ප්‍රනාන්දු සහ ඊ. සී. ප්‍රේමතිලක යන මහතුන් සහ නේවාසිකාචාර්ය ආර්. ජේ. ඇන්. ජෝඩන් මහතාද බන්ධනාගාර උප සුපිරින්ටැන්ඩන්ට්වරුන් වශයෙන් වැඩ බැලීමට.

ඒ. 33/60.

1960 පෙබරවාරි මස 15 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පළමුවෙනි පෙළේ ජේලර්වරු සී. ඇම්. කොටලිංගම් සහ පී. ඩබ්ලිව්. පෙරේරා යන මහතුන් බන්ධනාගාර උප සුපිරින්ටැන්ඩන්ට්වරුන් වශයෙන් වැඩ බැලීමට.

ඊ. ජී. ගුණවර්ධන,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
1960 පෙබරවාරි මස 29 වැනි දින,
තැ. පෙ. 500, කොළඹ 1.

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

1960 අංක 113

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේ ය :—

අංකය : ජේඒඒ. 18/48.

එම්. ඒ. එම්. හුසේන් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1960 මාර්තු 31 වැනි දින සිට ගාල්ලේ දිස්ත්‍රික් උසාවියේ අංක එල්. 4,693, පී. 1,352, එල්. 557, එල්. 6,125 හා පී. 1,891 නඩු අවසාන වන තුරු ඇසීමට හා තීන්දු දීමට, ගාල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒඒ. 21/48.

ඒ. ඊ. ආර්. කොරෙයා මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1960 අප්‍රේල් 1 වැනි දින සිට ගම්පොළ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 8,195 හා 9,838 නඩු අවසාන වන තුරු ඇසීමට හා තීන්දු දීමට, ගම්පොළ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 13ඒ/59.

ටී. ඩී. ජී. ද අල්විස් හා ඩබ්ලිව්. ඊ. අබේකෝන් යන මහතුන් නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ආර්. පී. ද සිල්වා මහතා 1960 පෙබරවාරි 20 වැනි දින සිට 22 වැනි දින දක්වා බලපිටියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 67/48.

එස්. තම්බිදුරේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ජේ. ජේ. ඩේවිඩ් මහතා 1960 පෙබරවාරි 18 වැනි දින සිට 24 වැනි දින දක්වා මඩකලපුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, මඩකලපුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 24/48.

එම්. ඒ. එම්. හුසේන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ජේ. එන්. සී. තිරුචෙල්වම් මහතා 1960 පෙබරවාරි 18 වැනි දින සිට 1960 මාර්තු 17 වැනි දින දක්වා කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, කොළඹ අතිරේක නාගරික මහේස්ත්‍රාත් ධුරයට හා කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 56ඒ/57.

ටී. එස්. සාලි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එෆ්. ඩබ්ලිව්. ගුණරත්න මහතා 1960 පෙබරවාරි 20 වැනි හා 21 වැනි දිනයන්හි, මීගමුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මීගමුවේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට හා මීගමුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 3ඒ/59.

ඒ. එම්. අමීන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එස්. ඩී. කරුණාරත්න මහතා 1960 පෙබරවාරි 20 වැනි දින සිට 22 වැනි දින දක්වා කුරුණෑගල කනදුල්ල පිහිටි උසාවියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා කුරුණෑගල කනදුල්ල උසාවියේ පිහිටි අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට (කුලියාපිටියේ නගර සභාව සීමාව තුල පිහිටි).

අංකය : ජේඑල්. 3ඒ/59.

ඒ. එම්. අමීන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු සී. වී. එස්. ද සිල්වා මහතා 1960 පෙබරවාරි 27 වැනි දින සිට 1960 මාර්තු 1 වැනි දින දක්වා කුරුණෑගල කනදුල්ල පිහිටි උසාවියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා කුරුණෑගල කනදුල්ල උසාවේ පිහිටි අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට (කුලියාපිටියේ නගර සභාව සීමාව තුල පිහිටි).

අංකය : ජේඑල්. 27ඒ/51.

අයි. එම්. ඉස්මයිල් මහතා නැවත වැඩ බාරගන්නා තුරු හෝ නැවත නියමයක් කරන තුරු පී. ජී. ද සිල්වා මහතා 1960 මාර්තු 10 වැනි දින සිට අවිස්සාවේල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා අවිස්සාවේල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 68සී/51.

සී. වී. උදලාගම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එස්. නටරාජා මහතා 1960 මාර්තු 2 වැනි දින සිට 6 වැනි දින දක්වා අනුරාධපුරයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, අනුරාධපුරයේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මන්නාරමේ හා වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, වවුනියාවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : පීඒඒ. 21/57.

එෆ්. ජේ. බී. පෙරේරා මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1960 මාර්තු 1 වැනි දින, වලස්මුල්ලේ ගම්බද උසාවියේ අංක සී. ආර්. එම්. 4,564 නඩුව ඇසීමට, තංගල්ල දිස්ත්‍රික්කයේ බටහිර ගිරුවා පත්තුවේ ගම්බද උසාවියේ අතිරේක සභාපති ධුරයට.

අංකය : පීඒඒ. 27/57.

ටී. මයිල්වාගනම් මහතා 1960 මාර්තු 4 වැනි දින, වවුනියාවේ ගම්බද උසාවියේ අංක සිවිල් 2,969 නඩුව ඇසීමට, වවුනියාවේ හා මන්නාරම් දිස්ත්‍රික්කවල, දකුණු වවුනියාවේ ගම්බද උසාවියේ හා මන්නායි ගම්බද උසාවියේ අතිරේක සභාපති ධුරයට.

අංකය : පීඑල්/ටී. 1/48.

එස්. වෙලෙමුරුගු මහතා නැති අතර ටී. මයිල්වාගනම් මහතා 1960 පෙබරවාරි 29 වැනි දින වවුනියාවේ හා මන්නාරම් දිස්ත්‍රික්කවල දකුණු වවුනියාවේ ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට හා මන්නායි ගම්බද උසාවියේ අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී. 7/56.

එම්. එම්. පෙරේරා මහතා නැති අතර අයි. එච්. බී. ඩී. විජේකෝන් මහතා 1960 පෙබරවාරි 29 වැනි දින මහනුවර දිස්ත්‍රික්කයේ දකුණු හා නැගෙනහිර මාතලේ ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඒඒ/57.

එම්. එම්. පෙරේරා මහතා වෙනත් රාජකාරිවල යෙදී සිටින බැවින් හෝ නැවත නියමයක් කරන තුරු එල්. සේනානායක මහතා 1960 මාර්තු 1 වැනි, 4 වැනි, 14 වැනි, 15 වැනි, 18 වැනි හා 21 වැනි දිනයන්හි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට හා වන්නි හත්පත්තුවේ, කටුගම්පොල හත්පත්තුවේ හා ගිරියාල හත්පත්තුවේ ගම්බද උසාවියේ අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/අයි. 4/53.

ජේ. ඊ. ඉලංගන්තිලක මහතා නැති අතර එස්. එච්. අබ්දුල් කාදර් මහතා 1960 පෙබරවාරි 29 වැනි දින කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඩබිලි හත්පත්තුවේ හා ගිරියාල හත්පත්තුවේ ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඒඒ. 6/57.

එෆ්. ජේ. සී. අබේකෝන් මහතා නැති අතර ඒ. පී. ගුණරත්න මහතා 1960 පෙබරවාරි 23 වැනි දින කළුතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර හා බස්නාහිර පස්දුන් කෝරලේ හා කළුතර තොටමුනේ ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඒඒ. 6/57.

එම්. ජේ. ටී. ද සිල්වා මහතා 1960 මාර්තු 3 වැනි දින, පින්වත්තේ ගම්බද උසාවියේ අංක සීආර්එම්. 9,828 නඩුව ඇසීමට, පානදුර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුනේ හා රයිගම් කෝරලේ ගම්බද උසාවියේ අතිරේක සභාපති ධුරයට.

අංකය : පීඑල්/ඊ. 1/48.

එම්. එහෙම්පර නාදන් මහතා නැති අතර වී. ආර්. සත්චිත්තානන්දන් මහතා 1960 පෙබරවාරි 19 වැනි දින ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කඩ්ඩුකුලම් හා තම්පලකාමම් පත්තු ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/එම්. 3/48.

එච්. මීදෙණිය මහතා නැති අතර, ඊ. ජී. බී. පෙරේරා මහතා 1960 පෙබරවාරි 26 වැනි දින කෑගලු දිස්ත්‍රික්කයේ බෙලිගල, පරණකුරු, ගල්බොඩ හා කිණිගොඩ කෝරලයන්හි ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට.

එස්. ආර්. විජේයතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1960 පෙබරවාරි 26 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය 573,
කොළඹ 12.

# වෙනත් පත්කිරීම්

**1960 අංක 114**

අංකය : සී. 32/රෙක් ව්.

## රාජකීය ලංකා නාවුක හමුදාවේ නිලධාරීන් උසස් කිරීම්

1960 ජනවාරි මස 1 වැනි දින සිට, වැඩබලන උප ලෙප්ටිනන්ට් වරුන් (ඇස්) වශයෙන් :—

මිඩ්ෂිප්මන් (ඇස්) පී. ඇම්. තාඹුගල, රාජකීය ලංකා නාවුක හමුදාව.

මිඩ්ෂිප්මන් (ඇස්) ආර්. ඇස්. ජයතිලක, රාජකීය ලංකා නාවුක හමුදාව.

1960 ජනවාරි මස 1 වැනි දින සිට, වැඩබලන උප ලෙප්ටිනන්ට් කෙනෙකු (ඊ) වශයෙන් :—

මිඩ්ෂිප්මන් (ඊ) ඞී. ඇන්. ඒ. බෙනරගම, රාජකීය ලංකා නාවුක හමුදාව.

එච්. ඊ. තෙන්නකෝන්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1960 පෙබරවාරි මස 22 දින,
කොළඹ.

---

**1960 අංක 115**

ඒ එම්. 17/1/51.

අග්‍රාණ්ඩුකාර උතුමාණන්වහන්සේ ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින්—

ටී. ඇස්. බූල් මහතා තංගල්ල අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු සහ නිල නොලත් මහෙස්ත්‍රාත් වරයෙකු වශයෙන් ද,

ඒ. ඇල්. කොරෙයිරා මහතා ත්‍රිකුණාමලය අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

ආර්. ඇම්. ඒ. රත්නායක මහතා කුරුණෑගල අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

සී. ඒ. චන්ද්‍රරත්න මහතා ගම්පහ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

සී. සී. ස්ටෙම්බො මහතා පානදුරය අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

ඇල්. බී. විජේසිංහ මහතා මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

සෙක්ස්ටස් කුරේ මහතා මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

ඇෆ්. ඇස්. වී. ද සිල්වා මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

ඞී. සී. සේනාරත්න මහතා ගම්පහ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

අයි. බායි මහතා මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද

ටී. බී. දුඹුකොල මහතා කෑගල්ල අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

ඇස්. ජේම්ස් මහතා කයිට්ස් අධිකරණ කොට්ඨාශය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

පී. ඞී. ද ඇස්. විජේරත්න මහතා බලපිටිය අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

ඇස්. විසුවලින්ගම් මහතා යාපනය අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

ඇස්. නාගේන්ද්‍රරාජ් මහතා යාපනය අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

කේ. ඒ. කන්දලම මහතා ගම්පහ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

පත්කර ඇත්තේ ය.

ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයෙන් 16 වෙනි පරිච්ඡේදයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්—

1960 ජනවාරි මස 19 වෙනි දින සිට ජී. එම්. ෆේපාන්සේකා මහතා නැවත වැඩ භාරගන්නාතුරු රත්නපුර දිස්ත්‍රික්කයේ පල්ලේ කෝරළේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට ජේ. එම්. සමරකෝන් බණ්ඩා මහතාද,

1960 පෙබරවාරි මස 11 වෙනි දින සිට වී. සෙල්ලදෛරෙයි මහතා නැවත වැඩ භාරගන්නාතුරු යාපනේ දිස්ත්‍රික්කයේ අලෙසිපිඩි සහ මන්ඩාතිව් යන කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට ආර්. රත්නසභාපති මහතාද,

1960 පෙබරවාරි මස 12 වෙනි දින සිට මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර කඩවත් සහ ගඟවට කෝරළේ හදිසි මරණ පරීක්ෂක ධුරයට ඉසිසෙඩ්. ඒ. එම්. සලීම් මහතාද,

1960 පෙබරවාරි මස 15 වෙනි දින සිට එස්. හබීබු මොහමඩු මහතා නැවත වැඩ භාරගන්නාතුරු මන්නාරම් දිස්ත්‍රික්කයේ ඉරුක්කිලම්පිඩි කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට සී. ඇලෙක්සැන්ඩර් මහතාද,

1960 පෙබරවාරි මස 19 වෙනි දින සිට බදුල්ල දිස්ත්‍රික්කයේ උඩුකිඳ ප්‍රාදේශීය ආදායම් නිලධාරි ධුරය දරණ කාලය තුළ ඩබ්ලිව්. තිලකරත්න මහතා එම කොට්ඨාශය සඳහා පරීක්ෂක වරයෙකු වශයෙන් ද,

පත්කර ඇත්තේ ය.

ජී. සී. ටී. ඒ. ද සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන ස්ථිර ලේකම්.

1960 පෙබරවාරි මස 29 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදී ය.

---

**1960 අංක 116**

## ගෘහ සේවකයන් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (115 වන පරිච්ඡේදය)

වර්ෂ 1947 ලංකා (ස්වාධීනතා) රාජ්‍ය සභා ආඥාවේ 8 වන වගන්තිය යටතේ පනවනු ලැබ වර්ෂ 1948 පෙබරවාරි මස 5 වන දින අංක 9,828 දරණ ආණ්ඩුවේ අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ප්‍රකාශයෙන් මඳ වශයෙන් සංශොධනය කරනු ලැබූ ගෘහ සේවකයන් ලියාපදිංචි කිරීම පිළිබඳ ආඥාපනතේ (115 වන පරිච්ඡේදය) 3 වන වගන්තිය යටතේ ගරු කම්කරු ඇමති තුමන් විසින් ගෘහ සේවකයන් ලියාපදිංචි කිරීමේ රෙජිස්ත්‍රාර් තැන වශයෙන් ටී. එච්. ක්‍රිස්ටෝපල්ස් මහතා වෙනුවට වර්ෂ 1960.1.1 වන දින පටන් ත්‍රිකුණාමලයේ පොලිස් පරීක්ෂක පී. බී. රත්නායක මහතා පත් කරන ලදී.

සී. බී. කුමාරසිංහ,
කම්කරු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1960 පෙබරවාරි මස 25 වන දින,
කොළඹදීය.

---

# රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය

**1960 අංක 117**

රෙජිස්ට්‍රාර් ජනරාල් තැන විසින් පහත සඳහන් පත් කිරීම කරන ලෙස නියම කර ඇත්තේ ය :—

සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකාර පඞ්ක්තියේ දෙවෙනි ශ්‍රේණියේ නිලධාරි තැන්පත් ඉහල ලන්දගේ පියදාස මහතා 1960 පෙබරවාරි 1 වෙනි දින සිට ගාල්ල පාලන දිස්ත්‍රික්කයේ අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් කෙනෙකු වශයෙන්.

ටී. ඊ. ගුණරත්න,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

1960 පෙබරවාරි 23 වෙනි දින,
කොළඹ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේදිය.

## ආණ්ඩුවේ නිවේදන

ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් වර්ෂ 1951 කේ අංක 13 දරණ මුස්ලිම් විවාහ හා දික්කසාද ආඥාපනතේ 15 (5) වැනි වගන්තිය යටතේ 1960.2.12 වැනි දින පටන් 1961 දෙසැම්බර් 31 වැනිදා වන තෙක් ක්වාසි මණ්ඩලයේ සාමාජිකයෙක් ලෙස කොළඹ 3, නො. 23, පොලිස් පාක් ඇවනිව්හි පදිංචි ඒ. සී. ඇම්. උවයිස් මහතා පත්කර ඇත.

එස්. සී. ප්‍රනාන්දු,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1960 පෙබරවාරි 18, කොළඹදිය.

---

රූ. ආ. වි. අ.—අංකය : ඩී.39/සිඊආර්.

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින්, 1934 ජනවාරි මස 26 වැනි දින පළවූ 8,029 අංක දරණ ගැසට් පත්‍රයේ සඳහන් නීති පනත් අනුව යුද්ධ හමුදාවේ ස්වේච්ඡා හට සේනාවේ පහත සඳහන් වොරන්ට් නිළධාරීන්ට කාර්යක්ෂමතා පදක්කම (ලංකා) සහ/හෝ එහි සන්ධාරයන් පිරිනමන ලදී :—

**2 (වී) ලංකා ශිෂ්‍ය භට කණ්ඩායම :**

1 වැනි සන්ධාරය—

ඩබ්ලිව්. ඕ. ii මිඩින් එම්. එස්.

**2 (වී) ලංකා සිංහ රෙජිමේන්තුව :**

කාර්යක්ෂමතා පදක්කම—

ඩබ්ලිව්. ඕ. ii ගුණවර්ධන එම්. පී.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

එච්. ඊ. තෙන්නකෝන්
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1960 පෙබරවාරි මස 17 දින,
කොළඹ දිය.

---

ඇල්. ඩී.—බී. 49/51.

## 1941 අංක 27 දරණ පඩිපාලක සභා ආඥාපනත

### නිවේදනයයි

වර්ෂ 1943 අංක 40 දරණ ආඥාපනතින් සංශෝධිත, වර්ෂ 1941 අංක 27 දරණ පඩි පාලක සභා ආඥාපනතේ 28 වන වගන්තිය යටතේ රා, අරක්කු හා විනාකිරි කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාව විසින් ඇති කරන ලදුව මීට යාව ඇති උපලේඛනයෙහි දක්වා ඇත්තාවූ තීරණයන් ගරු කම්කරු ඇමති තුමන් විසින් අනුමත කරන ලද බව එකී පඩි පාලක සභා ආඥාපනතේ 27 (3) වන වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ තීරණයෝ වර්ෂ 1960 අප්‍රේල් මස පළමු වන දින වලංගු බවට පැමිණෙති.

සී. බී. කුමාරසිංහ,
ස්ථිර ලේකම් වරයා.

1960.2.25 දින,
කොළඹ, කම්කරු අමාත්‍යාංශයේදිය.

## උපලේඛනය

රා, අරක්කු හා විනාකිරි කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1946 මැයි 24 වන දින අංක 9,560 දරණ ගැසට් පත්‍රයේ පළ වූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව සඳහන්ව ඇත්තාවූ ද වර්ෂ 1946 අගෝස්තු මස 30 වන දින අංක 9,594, වර්ෂ 1951 ඔක්තෝබර් මස 26 වන දින අංක 10,312, වර්ෂ 1952 ජනවාරි මස 25 වන දින අංක 10,345 සහ වර්ෂ 1956 සැප්තැම්බර් මස 28 වන දින අංක 10,976 දරණ ගැසට් පත්‍රවල පළවූ නිවේදනයන් හි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කරන ලද්දාවූ ද තීරණ, මෙහි පහත දැක්වෙන පරිද්දෙන් තවදුරටත් වෙනස් වේ :—

(1) එම උපලේඛනයේ II වන කොටස අස්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අභිනව කොටස යෙදීමෙන් :—

"II වන කොටස

රා, අරක්කු හා විනාකිරි කර්මාන්තයේ ඇතැම් කාර්යයන්ට අදාල වන්නාවූ කෑලි මිම්මේ වැඩට ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණයෝ—

| කාර්යය | ප්‍රමාණය |
|---|---|
| පොල්ගස් ඇදිම ... | ඇඳුන්නකට ශත 70යි |
| කඹ මාරු කිරීම ... | ඇඳුන් තකට ශත 35යි |
| කඹ කපා අස් කිරීම ... | ඇඳුන්තකට ශත 30යි |
| පොල්ගස් හැර ගැසීම ... | ගස් 110කට වැඩි නොවන අතුර කට රුපියල් 35යි |

තාබැරුම්වලට රා සැපයීම පිණිස පොල්, කිතුල් හෝ තල් ගස් මැදීම :—

| | |
|---|---|
| ගාලු දිස්ත්‍රික්කයේ ... | කම්කරුවකු ගෙනැවිත් දෙන රා ගැලුමකට ශත 54යි |
| බස්නාහිර පළාතේ ... | කම්කරුවකු ගෙනැවිත් දෙන රා ගැලුමකට ශත 61යි |
| හලාවත දිස්ත්‍රික්කයේ ... | කම්කරුවකු ගෙනැවිත් දෙන රා ගැලුමකට ශත 64යි |
| නුවරඑළිය හෝ මහනුවර දිස්ත්‍රික්කයේ | කම්කරුවකු ගෙනැවිත් දෙන රා ගැලුමකට ශත 65යි |
| මාතර, යාපනේ හෝ මාතලේ දිස්ත්‍රික්කයේ | කම්කරුවකු ගෙනැවිත් දෙන රා ගැලුමකට ශත 72යි |
| පුත්තලම්, අනුරාධපුර හෝ හම්බන්තොට දිස්ත්‍රික්කයේ | කම්කරුවකු ගෙනැවිත් දෙන රා ගැලුමකට ශත 77යි |
| බදුල්ල, රත්නපුර, කුරුණෑගල හෝ කෑගල්ල දිස්ත්‍රික්කයේ | කම්කරුවකු ගෙනැවිත් දෙන රා ගැලුමකට ශත 80යි |
| ත්‍රිකුණාමල, මඩකලපුව, මන්නාරම් හෝ මුලතිව් දිස්ත්‍රික්කයේ | කම්කරුවකු ගෙනැවිත් දෙන රා ගැලුමකට රුපියල් 1.05යි |
| ඉස්කාගාරවලට හෝ විනාකිරි සෑදීමට රා සැපයීම පිණිස පොල්, කිතුල් හෝ තල් ගස් මැදීම | කම්කරුවකු ගෙනැවිත් දෙන රා ගැලුමකට ශත 41යි |
| ඉස්කාගාරවලට හෝ විනාකිරි සෑදීමට හෝ රා සැපයීම පිණිස මල් තැලීම | පොල් කිතුල් හෝ තල් ගස් 100 කට වැඩි නොවූ විට රු. 62.50 ක්ද 100ට වැඩි සෑම එබඳු ගසකට ශත 62½ ක් ද වේ |
| තැබැරුම්වලට රා සැපයීම පිණිස මල් තැලීම | පොල්, කිතුල් හෝ තල් ගස් 25-40 දක්වා රු. 60 යි. |

කම්කරුවකු අරක්කු කර්මාන්තය සඳහා හෝ විනාකිරි සෑදීම සඳහා හෝ රා මැදීමෙහි යොදවා ගන්නා සෑම විටෙක, පොල්, කිතුල් හෝ තල් ගස් මැදීම පිළිබඳ වූ පූර්වෝක්ත වේතන ප්‍රමාණයන් අදාල වනුයේ, එම කම්කරුවා විසින් ගෙනැවිත් දෙන රාවල ඝන ප්‍රමාණයෙන් සියයට 7.5 කට නො අඩු මද්‍යසාර ප්‍රමාණයක් ඇති වූ විටය යන කොන්දේසියට යටත්වය. එසේ ද වුවත්, එකී රා වල සියයට 7.5කට අඩු ඝන ප්‍රමාණයක මද්‍යසාරය ඇතිවූ විට, එය ගෙනැවිත් දුන් කම්කරුවාට, රාවල ඇති මද්‍යසාරයෙහි සියයට ප්‍රමාණය 7.5ට සමාන වන ගණන පූර්වෝක්ත වේතන ප්‍රමාණයට සමාන වන්නේ යම් ප්‍රමාණයකටද ඒ ප්‍රමාණයේ ගණනක් ගෙවිය යුතුය."

(2) එම උපලේඛනයේ III වන කොටස අස්කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන අභිනව කොටස යෙදීමෙන් ද වේ :—

"III වන කොටස

මෙහි පහත 1 වන තීරයෙහි සඳහන් කම්කරුවන්ට කාල මිම්මේ වැඩවලට ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණයන් වනුයේ ඒ ඒ වැඩ යට කෙලින් 2 වන තීරයේ සඳහන් කර ඇති ගණන්ය.

කම්කරුවකු යම් මාසයක අවසර නැතිව වැඩට නොපැමිණි කාලය සතර දිනකට වැඩිවූ විට, වැඩ කරන ලද දින ගණනට 4ක් එකතු කළ කල්හි එය 30ට සමාන වන ගණන අවම මාසික වේතන ප්‍රමාණයට සමාන වන්නේ යම් ප්‍රමාණයකටද ඒ ප්‍රමාණයේ ගණනක් ඔහුට ඒ මාසයේ වේතනය වශයෙන් ගෙවිය යුතුය.

| 1<br>කම්කරුවන්ගේ පන්තිය | 2<br>ප්‍රමාණය<br>රු. ශ. |
|---|---|
| පහත සඳහන් කාර්යයන්හි යෙදී සිටින කම්කරුවෝ— | |
| අතුරු කංකානමගේ වැඩ—මසකට ... | 115 0 |
| රා තැබැරුම් මුරකරන්නාගේ වැඩ—මසකට ... | 63 0 |
| අරක්කු තැබැරුම් මුරකරන්නාගේ වැඩ—මසකට ... | 63 0 |
| අතුරු මුරකරන්නාගේ වැඩ—මසකට ... | 50 0 |
| එක්කාසු කරන ස්ථානයේ කළමනාකරුගේ වැඩ—මසකට ... | 85 0 |
| තැබැරුම්වල දී රා විකිණීමේ වැඩ—මසකට ... | 80 0 |
| තැබැරුම්වල දී අරක්කු විකිණීමේ වැඩ—මසකට ... | 75 0 |
| කර්මාන්තයේ රා අංශයේ—පොල්, කිතුල් හෝ තල් ගස්වලින් රා එක්කාසු කිරීම (රා ගෙන යාම, පැටවීම හා බෑම සහ පීප්ප, මහාබාල්දි, මුට්ටි සහ අනිකුත් භාජන සේදීමේ වැඩද ඇතුළුව)—මසකට | 80 0 |
| කර්මාන්තයේ අරක්කු අංශයේ—පොල්, කිතුල් හෝ තල් ගස් වලින් රා එක්කාසු කිරීම (ගෙනයාමේ වැඩද ඇතුළුව)—මසකට ... | 60 0 |
| කර්මාන්තයේ විනාකිරි අංශයේ—පොල්, කිතුල් හෝ තල් ගස්වලින් රා එක්කාසු කිරීම (ගෙන යාමේ වැඩද ඇතුළුව)—මසකට ... | 52. 50 |

| 1<br>කම්කරුවන්ගේ පන්තිය | 2<br>ප්‍රමාණය<br>රු. ශ. |
|---|---|
| ඉස්කාගාරයේදී රා පෙරීම—මසකට ... ... | 100 0 |
| බෝතල් කිරීම සහ අරක්කු බෝතලවලට ඇබ ගැසීම හා ලේබල් ගැසීම—වැඩ කරන එක් එක් සාමාන්‍ය දවසකට ... ... ... | 3 0 |
| දර කැපීම සහ පැලීම, ඉස්කාගාරවලදී පිප්ප, පිප්ප සෝදන පෙට්ටි බාල්දි හා අනිකුත් භාජන ශුද්ධ කිරීම හා සේදීම, අරක්කු ගෙන යාම, පැටවීම සහ බෑම, අරක්කු මැනීම, රා බෝතල් කිරීම හා එම බෝතල්වලට ඇබ ගැසීම, විනාකිරි සෑදීම, විනාකිරි බෝතල් කිරීම, එම බෝතල්වල ඇබ ගැසීම සහ ලේබල් ගැසීම සහ බෙදා හැරීම පිණිස විනාකිරි ගෙන යෑම—වැඩ කරන එක් එක් සාමාන්‍ය දවසකට ... ... | 3 0" |

---

ඇල්. ඞී.—බී. 207/41.

## 1941 අංක 27 දරණ පඩිපාලක සභා ආඥාපනත

### 7(1) වන වගන්තිය යටතේ නිවේදනයයි

වර්‍ෂ 1941 අංක 27 දරන පඩි පාලක සභා ආඥා පනතේ 6(1) වන වගන්තිය යටතේ කම්කරු ඇමතිවර චන්ද්‍රදාස විජේසිංහ වන මා අයිස් සහ සිසිල් බීම සෑදීමේ කර්මාන්තය සම්බන්ධයෙන් මීට යාව ඇති උපලේඛනයෙහි විස්තර වන නියෝගය පැනවීමට අදහස් කරන බව එකී 1941 අංක 27 දරන ආඥාපනතේ (වර්‍ෂ 1943 අංක 40 දරන ආඥා පනතේ 3 වන වගන්තියෙන් සංශෝධිත) 7(1) වන වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

යෝජිත මෙම ආඥාවට විරුඬව කීමට ඇති කරුණු සලකා බැලීම සඳහා වර්‍ෂ 1960 මාර්තු මස 30 වන දින දවල් 12 දක්වා මවිසින් භාර ගන්නවා ඇත.

සෑම විරුඬත්වයක් එසේ විරුඬවීමට හේතු භූතවූ කරුණු සඳහන් ප්‍රකාශයක්ද සහිත ලියවිල්ලකින් ඉදිරිපත් කළ යුත්තේය.

සී. විජේසිංහ
කම්කරු ඇමති.

1960 පෙබරවාරි මස 24 වන දින,
කොළඹදීය.

### උපලේඛනය

වර්‍ෂ 1941 අංක 27 දරන පඩි පාලක සභා ආඥා පනතේ II වන කොටසේ විධිවිධාන මෙහි පහත සඳහන් කර්මාන්තයට අදාල විය යුතුය :—

අයිස් සහ සිසිල් බීම සෑදීමේ කර්මාන්තය, එනම්—

සිසිල් බීම, අමද්‍යපාන වර්‍ග, රසමුසු සිරප් වර්‍ග, නොපැසූ පැනිරස බීම, ඖෂුමුසු බීම සහ අයිස් සෑදීම.

පහත දැක්වෙන වැඩ ද ඊට ඇතුළත් වේ—

(1) බෝතල සේදීමේ කටයුතු ;

(2) සිරප් පිළියෙල කිරීම ;

(3) බෝතල් කිරීම, පිරවීම, ඇබ ගැසීම, සහ ලේබල් ගැසීම ;

(4) නිෂ්පාදනයට පෙර සහ පසුව බෝතල ඇල්ලීම ;

(5) ඉහත සඳහන් කවර බීම වර්‍ගයක් වුවත් බෝතලවල හෝ වෙනත් භාජනවල පුරවා විකිණීමට සූදානම් කිරීම වශයෙන් කෙරෙන සියලුම කටයුතු ;

(6) අයිස් සෑදීම සම්බන්ධ සියලුම කටයුතු ;

(7) ඉහතකී බීම වර්‍ග සහ අයිස් ඒවා සාදන ස්ථානයේදී විකිණීම පිළිබඳ කටයුතු ; සහ

(8) ඉහතකී බීම වර්‍ග සහ අයිස් ගෙන යෑම, බාරදීම සහ (ඒවා සාදන ස්ථානයේදී හැර) විකිණීම පිළිබඳ වැඩ කටයුතු සහ එවැනි බීම වර්ග සහ අයිස් සාදන ව්‍යාපාරයේ සේවයෙහි නියුක්ත අය විසින්ම කරන විට හිස් බෝතල එකතු කිරීම.

එහෙත් පහත සඳහන් කම්කරුවන්ගේ වැඩ ඇතුළත් නොවන්නේය :—

(1) ලිපිකරුවෝ, කැෂියර්වරු, ගබඩාකරුවෝ, වේලා සටහන් කරුවෝ, ඕවර්සියර්වරු, මුරකරුවෝ සහ බලාගන්නෝ ;

(2) වර්‍ෂ 1945 නොවැම්බර් මස 2 වන දින අංක 9,481 දරන ගැසට් පත්‍රයේ පළවූ නියෝගයෙහි නියමිත මෝටර් රථ ගමනාගමන කර්මාන්තයෙහි නියුක්ත කම්කරුවන් ; සහ

(3) වර්‍ෂ 1944 ජනවාරි මස 7 වන දින අංක 9,224 දරන ගැසට් පත්‍රයේ පළවූ සහ අනතුරුව සංශෝධනය කරන ලද පරිද්දෙන් ගත යුතු නියෝගයෙහි නියමිත ඉංජිනේරු කර්මාන්තයෙහි නියුක්ත කම්කරුවෝ.

ඇල්. ඞී.—බී. 207/41.

## 1941 අංක 27 දරණ පඩිපාලක සභා ආඥාපනත

### 7(1) වන වගන්තිය යටතේ නිවේදනයයි

වර්‍ෂ 1943 අංක 40 දරන ආඥාපනතේ 3 වන වගන්තියෙන් සංශෝධිත වර්‍ෂ 1941 අංක 27 දරන පඩි පාලක සභා ආඥාපනතේ 6(1) වන වගන්තිය යටතේ කම්කරු ඇමතිවර චන්ද්‍රදාස විජේසිංහ වන මා ගුදිරි කොහු සහ ඇට කෙඳි කොහු පිටරට යැවීමේ කර්මාන්තය සම්බන්ධයෙන් මීට යාව ඇති උපලේඛනයෙහි විස්තර වන ආඥාව පැනවීමට අදහස් කරන බව එකී වර්‍ෂ 1941 අංක 27 දරන ආඥා පනතේ 7 (1) වන වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

යෝජිත මෙම ආඥාවට විරුඬව කීමට ඇති කරුණු සලකා බැලීම සඳහා වර්‍ෂ 1960 මාර්තු මස 30 වන දින දවල් 12 දක්වා මවිසින් භාර ගන්නවා ඇත. සෑම විරුඬත්වයක් එසේ විරුඬවීමට හේතු භූතවූ කරුණු ඇතුළත් ප්‍රකාශයක් ද සහිත ලියවිල්ලකින් ඉදිරිපත් කළ යුත්තේය.

සී. විජේසිංහ,
කම්කරු ඇමති.

1960.2.24 දින,
කොළඹදීය.

### උපලේඛනය

වර්‍ෂ 1941 අංක 27 දරන පඩි පාලක සභා ආඥාපනතේ II වන කොටසේ විධිවිධාන මෙහි පහත සඳහන් කර්මාන්තයට අදාල විය යුතුය :—

ගුදිරි කොහු සහ ඇට කෙඳි කොහු පිටරට යැවීමේ කර්මාන්තය, එනම්,

(i) නිෂ්පාදනය කරන ලද ගුදිරි කොහු සහ ඇට කෙඳි කොහු ගබඩාවලදී භාර ගැනීම ;

(ii) පිටරට යැවීම පිණිස ගුදිරි කොහු සහ ඇට කෙඳි කොහු සකස් කිරීමේ සහ පැක් කිරීමේ කටයුතු ; සහ

(iii) නැවට ගෙන යාම පිණිස ගුදිරි කොහු සහ ඇට කෙඳි කොහු ප්‍රවාහනය කිරීම.

(අ) පහත දැක්වෙන වැඩවල යෙදී සිටින කම්කරුවන්ගේ වැඩද ඊට ඇතුළති :—

(1) ලොරිවලින් හෝ කරත්තවලින් ගබඩාවලට කොහු භාර ගැනීම ;

(2) බැලස් සහ මිටි ගණන් කිරීම ;

(3) බැලස් සහ මිටිවල බර කිරීම ;

(4) කොහු තෝරීම ;

(5) බැලස් සහ මිටි අට්ටි ගැසීම ;

(6) බැලස් සහ මිටි අට්ටි කැඩීම ;

(7) බැලස් සහ මිටි ලිහීම ;

(8) අනවශ්‍ය දේ අස්කිරීම සහ කොහු ශුද්ධ කිරීම ;

(9) අවුල් කොහු මිටිකර බැඳීම ;

(10) අවුල් කොහු වේලීම ;

(11) බැලස් සහ මිටි ගබඩාවේ එක් අංශයක සිට තවත් අංශයකට ගෙනයාම ;

(12) ඇට කෙඳි අතින් පිරීම (එනම්, පිටරට යැවීම සඳහා සකස් කිරීම) සහ අත්මිටිවලට බැඳීම ;

(13) පාට කිරීම හඳහා පිළියෙල කිරීම් වශයෙන් අත්මිටිවලට නොබැඳ අතින් පිරීම (එනම්, පිටරට යැවීම සඳහා සකස් කිරීම) ;

(14) පාට කරන ලද ඇට කෙඳි අතින් පිරීම (එනම්, පිටරට යැවීම සඳහා සකස් කිරීම) සහ අත්මිටිවලට බැඳීම ;

(15) කපන ලද ඇට කෙඳි අත්මිටිවල අස්කොන් කැපීම ;

(16) ඇට කෙඳි බැමි කැපීම ;

(17) බිම තිබෙන කොහු, ප්‍රෙස් තට්ටුවට (එය උසක පිහිටා තිබේ නම්) විසි කිරීම ;

(18) ශුඞ කිරීමේ යන්ත්‍රවලට කොහු අල්ලීම ;

(19) බැලස් පෙට්ටිවල කොහු බැලස් කිරීම ;

(20) කොහු ලනුවලින් කොහු කඹ ඇඹරීම ;

(21) කොහුවලට ගෙන්දගම් දුම දැමීම ;

(22) කොහු පාට කිරීම ;

(23) ඇට කෙඳි අත්මිටි නියමිත දිග ප්‍රමාණවලට කැපීම ;

(24) යාන්ත්‍රික ජම්බාරවලින් හෝ වෙන ක්‍රමවලින් බේල් පෙට්ටිවලට කොහු ඇහිරීම ;

(25) බේල් ප්‍රෙස් යන්ත්‍ර පාලනය කිරීම හා ක්‍රියා කරවීම;

(26) බේල් මිටි වලයම් පටිවලින් හෝ කඹවලින් වෙළීම;

(27) බේල් අච්චි ගැසීම, අච්චි කැඞීම, උසුලාගෙන යාම, ඉවත් කිරීම, පැටවීම සහ බෑම;

(28) කොහු ඇඹරීම සහ සුළි දැමීම;

(29) බැලස් සහ මිටි බේල් ප්‍රෙස් යන්ත්‍රය වෙත ගෙන යාම;

(30) පෙට්ටි කරන්නන් අතට කොහු යැවීම;

(31) ප්‍රෙස් පෙට්ටි වැඩ කිරීම පිණිස වින්ච් ක්‍රියා කරවීම;

(32) උණ බම්බු ඉරීම සහ පැලීම;

(33) වලයම් පටි කැපීම;

(34) කොහු කඹ දඟ ඇරීම;

(35) කොහු පැක් කිරීමේදී සහ සකස් කිරීමේදී පාවිච්චි වෙන සුළු සුළු භාණ්ඩ භාර ගැනීම, ගණන් කිරීම, බර කිරීම, අඩුක් කිරීම, ඉවතට ගෙනයාම, කැපීම සහ පිළියෙල කිරීම;

(36) ප්‍රෙස් යන්ත්‍රය, තට්ටුව, වල සහ වටාපිටාව පිස දැමීම සහ සුද්ධ කිරීම;

(37) බේල් මිටි ගෝනිවලින් වසා මැසීම;

(38) කරදාසිවලින් හෝ ගෝනිවලින් බැලස් එතීම;

(39) නැවට පැටවීමට බඩු මිටි ලකුණු කිරීම;

(40) නැවට පැටවීමට බඩු මිටි ඉවත් කිරීම;

(41) කෑම සහ තේ පිළියෙල කිරීම හා බෙදීම;

(42) කංකානම් කෙනකුගේ වැඩ;

(43) පීරීම සඳහා තෙල් දීම;

(44) ගබඩා සහ කානු පිස දැමීම;

(45) ඉවත දැමීම සඳහා කොහු බත් සහ කුණු රොඩු අහක් කිරීම;

(46) කොහුබත් හැලීම;

(47) කොහුබත් සහ කුණු රොඩු ගෝනි කිරීම; සහ

(ආ) පහත දැක්වෙන කම්කරුවන්ගේ වැඩ හැර "අ" ඡේදයේ දක්වන ලද වැඩකටයුතුවලට සම්බන්ධ වූ හෝ අනියම් වූ හෝ වෙනත් වැඩ වේනම් ඒවා :—

(1) ලිපිකරුවෝ, ගබඩාකරුවෝ, වේලා සටහන්කරුවෝ, හරි වැරදි බලන්නෝ, ඕවර්සියර්වරු සහ මුරකරුවෝ;

(2) වෂී 1945 නොවැම්බර් මස 2 වන දින අංක 9,481 දරන ගැසට් පත්‍රයේ පළවූ නියෝගයෙහි නියමිත මෝටර් රථ ගමනාගමන කර්මාන්තයෙහි නියුක්ත කම්කරුවෝ;

(3) වෂී 1949 දෙසැම්බර් මස 16 වන දින අංක 10,054 දරන ගැසට් පත්‍රයේ පළ වූ සහ අනතුරුව සංශොධනය කරන ලද පරිද්දෙන් ගතයුතු නියෝගයෙහි නියමිත ගොඩ නැගිලි කර්මාන්තයෙහි නියුක්ත කම්කරුවෝ; සහ

(4) වෂී 1944 ජනවාරි මස 7 වන දින අංක 9,224 දරන ගැසට් පත්‍රයේ පළ වූ සහ අනතුරුව සංශොධනය කරන ලද පරිද්දෙන් ගතයුතු නියෝගයෙහි නියමිත ඉංජිනේරු කර්මාන්තයෙහි නියුක්ත කම්කරුවෝ;

---

## 1956 අංක 30 දරණ ධීවර (සංශෝධන) පනතින් සංශෝධිත, 1952 අංක 25 දරණ ධීවර (සංශෝධන) ආඥාපනතේ 18 ඒ 3 වැනි වගන්තිය යටතේ කරන නිවේදනයයි

1952 අංක 25 සහ 1956 අංක 30 දරණ ධීවර (සංශෝධන) පනත් වලින් සංශෝධිත, 1940 අංක 24 දරණ ධීවර ආඥාපනතේ 18ඒ (1) වගන්තිය ප්‍රකාර, කර්මාන්ත හා ධීවර ගරු ඇමති ජේ. ඩී. වීරසේකර මහතා විසින් ගාලු දිස්ත්‍රික්කයේ තෙල්වත්ත වරාය තුල මාදැල් වට කිරීම සම්බන්ධයෙන් එක්තරා පුද්ගලයන් කණ්ඩායම් අතර පැන නැගුණ ආරාවුලක් පිළිබඳව ප්‍රසිද්ධ විභාගයක් පැවැත්වීමට හා රපෝර්තු කිරීමට මට පවරා තිබේ.

2. ආරාවුලට අඩංගු කරුණු මෙසේය.

(i) තෙල්වත්ත වරායේ මාදැල් වට කිරීමේ වාරයන් බෙදා දීම සඳහා මාදැල් දැනට ලියා පදිංචි කරනු ලබන්නේ ගාලු දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති විසිනි. අවුරුදු කිහිපයක් තිස්සේම, තෙල්වත්තේ පදිංචි, ඒ. අන්දෝරිස් සිල්වා, ඒ. ශීද්‍රික් සිල්වා, එන්. එච්. අයනෝරිස් සිල්වා, ඒ. බාරොන් සිල්වා, අන්තෝනි ආරොන් සිල්වා, ඒ. මනෝ සිංඤෝ ඤෝ, එල්. ඞීසන් සිල්වා යන අයට පමණක් දී තිබේ. තෙල්වත්තේ පැරැලිය මස් මරන්නන්ගේ සමූපකාර ණය ගනු දෙනු හා වෙළඳ සමිතිය සංවිධානය කළ මස් මරන්නන් කණ්ඩායමක් ඔවුනට ද තෙල්වත්ත වරායේ මාදැල් වට කිරීමට වාරයන් ලබා දෙන ලෙස ඉල්ලා සිටී. තෙල්වත්ත වරායේ මාදැල් වටකිරීමේ වාරයන් ඇති සමහරෙක්, සමිති යට මස් මැරීමේ කිසිම වාරයක් දීම ගැන විරුද්ධ වෙති.

(ii) තවද, මාදැල් වට කිරීමට තම තමාට ලැබී ඇති වාරයන් සම්බන්ධයෙන් තෙල්වත්තේ ඒ. ගිදිරිස් සිල්වා සහ තෙල්වත්තේ ඒ. අන්දෝරිස් සිල්වා අතරත් තෙල්වත්තේ එල්. ඞීසන් සිල්වා සහ තෙල්වත්තේ එන්. එච්. අයනෝරිස් සිල්වා අතරේත් ආරාවුලක් නැග තිබේ.

(iii) තෙල්වත්ත වරායේ මාදැල් වටකිරීමට තමාටද අවසර දෙන ලෙස තෙල්වත්තේ විල්බට් පියදාස විසින් ඉල්ලුම් කර තිබේ.

3. මේ ආරාවුලට අඩංගු කරුණු ගැන පමණක් නොව, එයට සම්බන්ධවූත්, අදාලවූත්, එයින් පැන නගින්නාවූත් කරුණු ගැන ප්‍රසිද්ධ විභාගයක් පැවැත්වීමට හා රපෝර්තු කිරීමට මට පවරා තිබේ.

4. මේ ආරාවුලට සහභාගි වී ඇති හෝ ආරාවුල ගැන උනන්දුවක් දක්වා හෝ යමෙක් ආරාවුල සම්බන්ධ කරුණු ලියැවිලි මගින් ඉදිරිපත් කිරීමට සතුවූ නම්, 1960 මාර්තු 28 වැනිදා හෝ ඊට පෙර කොළඹ, ගාලු මුවදොර, ධීවර අධ්‍යක්ෂගේ කාර්යාලයට ලැබෙන පරිදි ඒවා එවන්න.

5. මේ ආරාවුල සම්බන්ධ ප්‍රසිද්ධ විභාගයක් 1960 මැයි 28 වැනිදා පෙරවරු 10 ට හික්කඩුව තානායමේදී මා විසින් ආරම්භ කරණු ලැබේ. කලින් ඉදිරිපත් කර ඇති කරුණු ඔප්පු කිරීම සඳහා සාක්ෂි දීමට බලය ඇති සියලු දෙනාටම ඔවුන් විසින්ම හෝ කිසියම් මිත්‍රයකු මගින් හෝ නීතිඥයකු මගින් මෙදින සාක්ෂි ඉදිරිපත් කළ හැක.

එස්. එස්. ජේ. ගුණසේකර.

1960 පෙබරවාරි 17 වැනිදා,

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## 1946 යේ අංක 32 දරණ වාරිමාර්ග ආඥාපණත

රත්නපුර දිස්ත්‍රික්කයේ රජයේ දිසාපති තැන්පත් ලයනල් බාකොප්ච් අබයරත්න මහතා විසින් 1946 යේ අංක 32 දරණ වාරිමාර්ග ආඥාපණතේ අංක 113 දරණ වගන්තියේ ප්‍රකාර මා වෙත පවරා ඇති බලතල අනුව, රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන්පත් බී. සී. ආර්. ජයසිංහ වන මම, යටකී වාරිමාර්ග ආඥාපනතේ අංක 15 (1) (ඒ) දරණ වගන්තියේ ප්‍රකාර පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් යෝජනාව අනුමත කරමි.

බී. සී. ආර්. ජයසිංහ,
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන,
රත්නපුර දිස්ත්‍රික්කය.

ගොවිජන සේවා කායසීාලය,
බටුගෙදර, රත්නපුර.
1960.2.24.

### උපලේඛනය

"1946 යේ අංක 32 දරණ වාරිමාර්ග ආඥාපණතේ V වැනි කොටස යටතේ සකස් කරනු ලැබූ, රත්නපුර දිස්ත්‍රික්කයේ කඩවත මැද කෝරලේ මුත්තෙට්ටුවේගම පිහිටි පහළ වෙල්යායේ අමුණ නමැති සුළු වාරි කර්මාන්තය නැතිම, එකී සුළු වාරි කර්මාන්තයෙන් ප්‍රයෝජනය ලැබිය හැකි කුඹුරු පිහිටි ප්‍රදේශයේ පදිංචි කුඹුරු හිමියෝ වන අපි, අපේ මෙම රැස්වීමේදී යටකී සුළු වාරි කර්මාන්තය නැතිම අනුමත කරන අතරම එකී වාරි කර්මාන්තයෙන් ප්‍රයෝජනය ලැබිය හැකි සියළුම කුඹුරු රත්නපුර දිස්ත්‍රික්කයේ රජයේ දිසාපති තුමන්ගේ සතුටට හේතුවන අයුරු වැඩ කිරීමටද එකඟ වෙමු."

---

### දැන්වීමයි

මාතර දිස්ත්‍රික්කය තුළ දෙනියායේ සහ අකුරැස්සේ පිහිටි තානායම් දෙක වර්ෂ 1960 මාර්තු මස 18 වැනි සහ 19 වැනි දෙදිනට මහජනයාගේ ප්‍රයෝජනය සඳහා විවෘත නොකෙරෙනවා ඇත.

ඒ. අයි. මොහිදීන්,
මාතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

කච්චේරිය, මාතර.
22.2.60.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරනු ලබන සංශෝධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ **ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාදා දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ නමක් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා **1955 ජනවාරි 1 වැනි දින සිට** අය කරන ගාස්තු මෙසේ යි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම **පස්වරු 3.30ට** සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් **කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති** තැනට ලැබෙන සේ **එවිය යුතුයි. (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. දායක මුදල් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... ... | එක් කාණ්ඩයක් සඳහා ... | 15 | 0 |
| | I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිට පතකට ... ... | ... ... | | 25 |
| | තැපැල් ගාස්තුවත් සමග ... | | 31 |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | ... ... | | 10 |
| | තැපැල් ගාස්තුවත් සමග ... | | 14 |

15. **පරණ ගැසට් කොපි තිබේ නම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. මෙය කොළඹ රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැනගෙන් ඉල්ලුම් කළ යුතුයි.**

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.